මාධ්‍ය නිවේදන අංක LAE/2023/01

දැන්වීමයි
මැතිවරණ කොමිෂන් සභාව

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වන අධිකාරය) 26 වන වගන්තිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාව හැර දිවයිනේ සෙසු සියලුම පළාත් පාලන ආයතනවලට නගරාධිපති/ නියෝජ්‍ය නගරාධිපති/ සභාපති, උප සභාපති සහ සභිකයන් තෝරා පත්කර ගැනීමට අදාළ ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාරගැනීමේ දැන්වීම 2023.01.04 දින සිට අදාළ සියළුම පළාත් පාලන ආයතනවල ප්‍රසිද්ධ කොට ඇත.

පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් පළමු නාමයෝජනා පත්‍රයේ හා දෙවන නාමයෝජනා පත්‍රයේ නාමයෝජනා කළ යුතු අපේක්ෂකයන් ගණන, පළමු හා දෙවන නාමයෝජනා පත්‍රවලට ඇතුළත් විය යුතු අවම කාන්තා අපේක්ෂිකාවන් ගණන සහ පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් පිළිබඳ තොරතුරු අදාළ නාමයෝජනා දැන්වීමේ මෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 23/1244 දරන හා 2022.12.29 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ද පළ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය www.elections.gov.lk හි ද මෙම තොරතුරු ප්‍රසිද්ධ කොට ඇති බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2023 ජනවාරි මස 04 දින.